වැඩ බැරි දස ගැන කතා

නිකොලායි නෝසව්

14

නගර සංචාරය

KANOL PUBLISHING HOUSE (PVT) LTD.

වැඩ බැරි දූස ගැන කතා

නිකොලායි නෝසව්

14

නගර සංචාරය

අනුවාදය

© නිරූපමා සෙනරත්

චිත්‍ර

බරිස් කලෞෂින්

පරිගණක සැලසුම - මාලක ලලනජීව

මුද්‍රණය 2026

KANOL

PUBLISHING HOUSE (PVT) LTD.

හිමවතී, නිල්මිණි සහ වැඩ බැරි දාස හීන් විලෝ දඬු හිටවා හදාපු වැටවලින් වට කරපු වීදියකට ගියා. වැටවලට එහා හුරුබුහුටි නිවාස දකින්නට ලැබුණා. ඒවායේ පියසි කොළ පාටයි රතු පාටයි. නිවාසලට ඉහළින් උසට පෙනුණෙ මහ විශාල ඇපල්, පෙයාර්ස් සහ ප්ලම් ගස්. ගෙවතුවල වගේම වීදිවලත් ගස් වැවිලා තිබුණා. ගහකොළ හරි හරියට වැවිලා තිබුණ මේ වීදියට කිව්වෙ 'හරිත පුරය' කියලයි.

වැඩ බැරි දාස හරිම උනන්දුවෙන් වටපිට බැලුවා. හැම දෙයක්ම හරිම පිරිසිදුයි. හැම ගෙවත්තකම වාමන පැංචියෝ වැඩ කරනවා දැක්කා. සමහරු තණකොළ කැපුවා. සමහරු පාරවල් අතු ගෑවා. තවත් අය බුමුතුරුණුවල දූවිලි ගසා පිස දමා පිරිසිදු කළා. මේ බුමුතුරුණු හරිතපුරයේ නිවාස ඇතුළත විතරක් නොවෙයි, පදික වේදිකා සහ වීදිවලත් අතුරා තිබුණා. මග යන එන අය මේ බුමුතුරුණු කිලිටි කරාවි කියා, සමහර ගෘහිණියන් හරියට බය වුණා. ඉතින් ඒ අය වැට අසල හිටගෙන ඒවා උඩින් ගමන් නොකරන ලෙසට ඉල්ලා සිටියා. එහෙම යනවා නම් ඉස්සර වෙලා කකුල් හොඳට පිස දමා ගන්න කියලත් කිව්වා.

බොහොමයක් ඉදිරිපස උද්‍යානවල බිමට බුමුතුරුණු අතුරලා. නිවාසවල පිටත බිත්තිවලත් විසිතුරු බිත්ති සැරසිලි එල්ලා තිබුණා.

හරිතපුරයට ජලය සැපයුම සිද්ධ වුණේ නළ මාර්ගයෙන්. ඒ නළ සාදා තිබුණේ උණ බම්බුවලින්. හැම කෙනෙක්ම දන්නවනෙ උණ බම්බු ඇතුළත කුහරයක් තියෙනවා කියා. ඒ හින්දා කිසි කරදරයක් නැතිව නළයක් විදිහට යොදා ගන්න පුළුවන්. ඔබ හිතන්න පුළුවන් මේ ජල නළ බිම දිගේ අතුරලා තිබුණා කියලා. ඒත් එහෙම නොවෙයි. ඒවා තිබුණේ, දිරා නොයන විදිහට ලී කණු උඩ රැඳවලායි.

වාමනයෝ ඒවායේ කාන්දු වීම් ගැන සෝදිසියෙන් සිටිමින් ඒවා හොඳින් නඩත්තු කළා. මේ විදිහට කාලයක් තිස්සේ කරගෙන ආවා. ප්‍රධාන නළයෙන් බෙදී ගිය කොටසක් සෑම නිවසකට ම සම්බන්ධ වුණා. ඒ හැරුණාම හැම නිවසක ම ඉදිරිපස වතුර මලක් තිබුණා. මේවා හරිම අලංකාරයි වගේම ප්‍රයෝජනවත්. ඒ වතුරමල්වලින් වැස්සෙන වතුර උද්‍යානවලට යෙදුවා. හැම ගෙදරකම පසුපස බීට්රූට්, කැරට්, ටර්නිප්, රාබු වගේ නොයෙක් එළවලු වවාපු උද්‍යානයකුත් තිබුණා.

ගෑනු ළමයින් කීප දෙනෙකු එක ගෙවත්තක එළවළු එකතු කර කර ඉන්නවා වැඩ බැරි දාස දැක්කා. ඉස්සරවෙලාම ඔවුන් කැරට් අලයක් හෝ ටර්නිප් අලයක් හාරා ගත්තා. ඊට පස්සෙ ඒ අලය මුදුනෙ ලණුවක් ගැට ගසා උපරිම ශක්තිය යොදා ඇදගෙන ගියා. ඒ විදිහට මුලින් උදුරා ගන්නා ටර්නිප් අල නැත්නම් කැරට් අල ගෙදර ගෙන ගියේ කෑ ගසමින් හයියෙන් හිනා වෙමින්.

"ඇයි ඔබගේ නගරයෙ ගැහැනු ළමයි විතරක් පේන්න ඉන්නෙ? පිරිමි ළමයි ඇත්තෙම නැද්ද මෙහෙ? වැඩ බරි දාස ඇහුවා.

"නැහැ. ඇත්තෙන්ම නැහැ. පිරිමි ළමයි ඔක්කොම ගිහින් ගං ඉවුරේ පදිංචි වුණා. ඔවුන්ට වෙනම නගරයක් හදාගෙන. ඒකට කියන්නෙ 'සරුංගල් පුරය' කියා. "

"ඔවුන් එහෙම කළේ මොකද?" වැඩ බැරි දාස ඇහුවා.

"ඒ අය වැඩිය කැමැති එහෙට. ග්‍රීෂ්ම කාලෙදි මුළු දවසම ඉර අව්වෙ වැතිරිලා ඉන්නවා, පීනනවා. ශීත කාලෙට හිම ක්‍රීඩා කරනවා. වසන්තයෙදි ගඟේ වතුර ඉහළ ඇවිත් නගරය යට වෙන්න ගං වතුර ගැලුවහම හොඳට විනෝද වෙනවා. "

"ඔවුන්ට එයින් ලැබෙන විනෝදය මොකක්ද?" පුදුමයට පත් වූ වැඩ බැරි දාස ඇහුවා.

"මම දන්නෙ නැහැ" හිමවතී කිව්වා.

"ඒත් අපේ වාමන පිරිමි ළමුන් ඒකට හරි කැමැතියි. ඔවුන් බෝට්ටුවලින් ගිහින් අනික් අයව ගං වතුරෙන් බේරාගන්නවා. ඔවුන්ගේ ආසාව වීර ක්‍රියාවල යෙදෙන්නටයි."

"මමත් එහෙමයි." වැඩ බැරි දාස කිව්වා. "ඔබ හිතනවද මට ඒ අයව අඳුනගන්න ලැබෙයි කියල."

"නෑ. ඔබට බැරි වෙයි." නිල්මිණී කිව්වා.

"ඔක්කොටම ඉස්සර වෙලා සරුංගල් පුරයට යන්න හරියට ම පැයක් ගත වෙනවා. දෙවනුව අපේ වාමන පිරිමි ළමුන් ඔයාගෙ ඔළුවට නරක අදහස් දමාවි. තුන්වෙනුව අපි ඔවුන් එක්ක වචනයක්වත් කතා කරන්නෙ නෑ."

"ඒ මොකද?"

"ඒකට හේතුවක් තියෙනවා." නිල්මිණී කිව්වා.

"ඔවුන් පහුගිය ශීත කාලේ අළුත් අවුරුදු උත්සවයට අපට ආරාධනා කළා. සංගීතය සහ නැටුම් එහෙමත් තියෙන බව කිව්වා. ඒත් අපි ගියා විතරයි... ඔබ දන්නවාද මොනවද කළේ කියා. අපි දිහාවට හිම බෝල විසි කෙරුවා."

"ඉතින් මොකද?" වැඩ බැරියා කිව්වා.

"ඉතින් මොකද? එදා ඉඳලා අපි ඔවුන් සමග කතාවක් නෑ. කිසි කෙනෙක් ඔවුන් බලන්න ගියෙත් නැහැ."

"ඔවුන්, ඔබලාව බලන්න එන්නෙත් නැද්ද?."

"නෑ... එන්නෙ නැහැ. මුලදි සමහරෙක් එන්න හැදුවා. ඒත් ඔබ විශ්වාස කරනවාද ගැහැනු ළමයින් එක්කෙනෙක්වත් ඔවුන් සමග සෙල්ලමට යන්නෙ නෑ. දඟ වැඩ කරන්න ගත්තු හින්දා අපි එහෙම පිටින්ම ඔවුන්ව එළවා දැම්මා. ජනේල කැඩුවා. වැටවල් කඩා දැමුවා" හිමවතී කිව්වා.

"ඊළඟට ඔවුන් අපේ නගරයට නියපොත්තා කියන ඔල්මාදකාරයෙකු එව්වා" නිල්මිණී කිව්වා. "එහෙමත් දෙයක්..."

"ඒ විතරක්යැ?" හිමවතීත් කතාවට එකතු වුණා. "දඟ වැඩ හින්දා ඔවුන්ව එපා වෙලා. ඔහු ආවෙ අපිත් එක්ක යාළු වෙන්න ආවා කියාගෙන තමයි. ඉතින් අපිත් ඔහුට අපේ නගරයේ පදිංචි වෙන්න අවසර දුන්නා. ඔබ දන්නවද මොනවද කළේ කියලා. මහ රෑ ජනේලෙන් එළියට පැනලා එක ගෙදරක දොරට පොල්ලක් හරස් කරලා තිබ්බා. උදේට කාටවත් එළියට යන්න බැරි වෙන්න. තවත් ගෙයක දොරට උඩින් ලී කොටයක් එල්ලුවා, උදේට දොර අරින කෙනාගෙ ඔළුවෙ වැදෙන්න. තුන්වෙනි ගෙදර පඩි පෙළ හරහට

නූලක් ගැට ගැහුවා එළියට එන කෙනෙක් පැටලිලා වැටෙන්න. හතරවෙනි ගෙදර දුම් කවුළුව බිමට දැම්මා. පස්වෙනි ගෙයි ජනේල කැඩුවා..."

වැඩ බැරි දාසට හිනා යන්නත් ආවා, මේ කතා සේරම අහගෙන ඉඳලා.

"ඔබට නම් විහිළු" නිල්මිණි කිව්වා.

"ඒත් ඔබ තේරුම් ගන්න ඕනෑ, කීයක් නම් ගැහැනු ළමයින්ගේ නාසය උඩ ගෙඩි ගැහුණද? දුම් කවුළුව හදන්න වහළට නැගපු ගැහැනු ළමයා බිම වැටිලා කකුල නොකැඩි බේරුණේ යාන්තමින්.

"මම ගැහැනු ළමයින්ට හිනා වෙනවා නොවෙයි" වැඩ බැරි දාස කිව්වා.

"ඔය නියපොත්තා කියන එක්කෙනාටයි මම හිනා වුණේ."

"හිනා වීම නොවෙයි. ඔහුට දඬුවම් කළ යුතුයි. තවත් ඔහොම නරක වැඩ කරන්න නොහිතෙන්න" හිමවතී කිව්වා.

මේ වෙන කොට ඔවුන් වීදියේ මැදට වෙන්න තිබුණ ඇපල් ගසක් පසු කරමින් හිටියා. ගහේ හැම අත්තකම හොඳට ඉදුණු රතුම රතු පාට ඇපල්

තිබුණා. ලී ඉනිමඟක් ගහට හේත්තු කර තිබුණා. ඒත් ඒකේ උස ගසෙන් අඩක් තරමයි. ඉහළ අතුවලින් පහතට එල්ලී තිබුණේ ලණු ඉණිමඟක්. ගැහනු ළමයින් දෙන්නෙක් ගස උඩ හිටියා. එක්කෙනෙක් ඇපල් ගෙඩියක නැට්ට කියතකින් කප කපා හිටියා. අනික් ගැහැනු ළමයා ඇයව වැටෙන්නෙ නැති වෙන්න අල්ලාගෙන හිටියා.

"පරිස්සමෙන්" නිල්මිණි වැඩ බැරි දාසට අවවාද කළා.

"ඇපල් ගෙඩියක් හිසට වැටී ඔබ මරණයට පත්වෙන්න බැරි නැහැ."

"මං... නෑ... මගේ හිස් කබල හොඳට හයියයි."

"කොල්ලන් හැම විටම හිතනවා ඔවුන් නියම වීරයන් කියා. ඊත් අපිත් ඒ වගේ ම එඩිතරයි නොවෙද?" හිමවතී කිව්වා. "අර ගැහැනු ළමයින් දෙන්නා නැගලා තියෙන උසක තරම බලන්නකෝ."

"ඊත් ගැහැනු ළමයින් කවදාවත් බැලුනයකින් ඉහළ යන්නේවත් මොටෝ රියක් පදවන්නේවත් නැහැ නෙවද?" වැඩ බැරි දාස කිව්වා.

"ඕ... නැත්තෙ මොකද?"

හිමවතී කිව්වා.

"අපේ ගැහැනු ළමයින් හුඟ දෙනෙක් රිය පදවන්න දන්නවා."

"ඉතින්... මොටෝ රියක් තියෙනවා යැ."

"තියෙනවා. ඊත් දැන් ඒක කැඩිලා ඒක හදාගන්න හැටි අපි දන්නෙ නැහැ. සමහර විට ඔබ අපිට උදවු කරාවි."

"ඇත්තෙන්ම... මම කරන්නම්" වැඩ බැරි දාස කිව්වා.

"රථ වාහන ගැන මමත් ටිකක් දන්නවා. ඉස්කුරුප්පු බාස් උන්නැහෙයි මුරිච්චියයි රෝහලෙන් පිට වුණ හැටියෙම මම ඒක කරවලා දෙන්නම්."

අනේ... බොහොම ස්තුතියි" හිමවතී කීවේ අත්පුඩි ගසමින්.

මේ වෙලාවෙ වැඩ බැරි දාසගේ ඇස් දෙකම එළිය වැටුණේ කවදාවත් නොදැකපු අපූරු දෙයක් දැකලයි. වීදියේ මැද හරියට වෙන්න මහ විශාල කොළපාට බෝල වගයක් තිබුණා. ඒවායෙන් එකක් තට්ටු දෙක තුනක් තියෙන ගෙයක් තරමට විශාලයි.

"ඒවා බැලුන් ජාතියක්ද?" වැඩ බැරි දාස ඇහුවා.

හිමවතී සහ නිල්මිණි හිනා වුණා.

"ඒවා පැණි කොමඩු" දෙදෙනාම කිව්වා.

"ඔබ මීට කලින් කවදාවත් පැණි කොමඩු ගෙඩියක් දැකලා නැද්ද?"

"කවදාවත් නෑ." වැඩ බැරි දාස කිව්වා.

"අපේ පළාතේ පැණි කොමඩු වැවෙන්නෙ නෑ. මේවායින් මොනවද කරන්නෙ?"

"පැණි කොමඩු මොනවාටද කියා නොදන්නා කොල්ලෙක්" හිමවතී හිනා වුණා.

"තව ඩිංගකින්, ඇපල් මොකටද, පෙයාර්ස් මොකටද කියලා අහයි."

"ඔයා කියන්නෙ ඒවා ඕගොල්ලො කෑමට ගන්නවා කියලද?"

වැඩ බැරි දාස ඇහුවෙ පුදුම වෙලා.

"මේ තරම් ලොකු එකක් කාලා ඉවර වෙන්න අවුරුද්දක්වත් යාවි නොවැ."

"අපි ඒවා කන්නෙ නෑ" නිල්මිණී කිව්වා.

"ඒවායෙන් ඉස්ම පෙරා ගන්නවා. ඒවා සිරප් වගේමයි. එක කොමඩු ගෙඩියක යටින් හිලක් හැදුවොත් බැරල් ගොඩක් පුරවලා ඉස්ම ගන්න පුළුවන්."

"කවුද මේවා හිටවන්න හිතුවෙ?" වැඩ බැරි දාස ඇහුවා.

"හරි ම නුවණක්කාර පුංචි ගැහැනු ළමයකු වන තිසල්" නිල්මිණි කිව්වා.

"එළවලු පලතුරු වගා කිරීමට ඇය කැමැතියි. අලුත් භෝග ජාති හොයා ගන්නත් ඇය හරි කැමැතියි. අපිට කවදාවත් පැණි කොමඩු කන පුරුද්දක් තිබුණෙ නැහැ. ඒත් දවසක් දා කැලේ වැවෙන පැණි කොමඩු දැකපු බව කවුදෝ කෙනෙක් කිව්වා. ඒ ශරත් කාලයෙදි ඒ ගැන සොයා බලන්න

හිතාගෙන තිසල් ගවේෂණ චාරිකාවක යෙදුණා. කැලෑ කොමඩු හම්බ වෙනකම්ම හොඳින් සෝදිසි කළා. ආපහු ආවෙ කොමඩු ඇටත් අරගෙන. ඊළඟ වසන්ත කාලෙදි ඒවා හිටෙව්වා. ඒ පැළවලින් ලොකුම ලොකු කොමඩු ගෙඩි ලැබුණා. ඒ වුණාත් ඒවායේ යුෂ හරිම ඇඹුලයි. ඇය රෑ දවල් නොබලා වැඩ කරමින් ඒවායේ රස පරීක්ෂා කළා. අන්තිමේදි වැඩිය ඇඹුල නැති ගෙඩි වගයක් සොයා ගත්තා. ඊළඟ අවුරුද්දේ ඒ ඇට පැළ කළා. ඒ අළුත් පැළවලින් ලැබුණ ගෙඩි ඒ තරම් ඇඹුල් වුණේ නැහැ. ඊළඟ අවුරුද්දේ ඇය පැළ කරගත්තෙ ඒ ගෙඩිවල ඇට. ඒ වතාවෙ හොඳ පැණි රසය ඇති ගෙඩි ලැබුණා. තවත් අවුරුද්දක් ගත වෙද්දි ඒ ගෙඩිවලින් පැණි රස ම ගෙඩිය තෝරලා එහි ඇට පැළ කර ගත්තා. මේ විදිහට මී පැණි තරම් රස ඇති පැණි කොමඩු ලැබෙන තෙක් අවුරුදු පතා දිගට ම කරගෙන ගියා."

"දැන් හැමෝම තිසල් ගැන හොඳ කියනවා. ඒත් එයාට බණින අයත් ඉන්නවා."

"ඇයි එයාට බණින්නෙ? මොන හේතුවකට ද?" වැඩ බැරි දාස ඇසුවා.

"මේ කොමඩුවලින් ඇති වැඩක් නෑ කියලා හිතනවා නොවැ. ඇරත් කොමඩුවලින් මුළු නගරය ම වැහිලා ගිහින්. පාරවල් දිගේ ඇවිදින්නත් අමාරුයි. ඒවා ගෙවල් අයිනෙමයි වැවෙන්නෙ. ගෙඩි පුංචි කාලෙදි නම් කරදරයක් නැහැ. ඒත් ඒවා ලොකු වෙනකොට බිත්ති කැඩිලා යනවා. ඔය කොමඩු ගෙඩියක් හන්දා එක ගෙයක ලොකු හිලක් හැදුණා. අපේ ගෑනු ළමයින්ට කොමඩු වගාව තහනම් කරන්නත් ඕනෑ වුණා. ඒත් අනෙක් අය තිසල්ගෙ පැත්ත අරගෙන ඈයගේ වැඩවලට උදවු කළා."

මේ වෙද්දි ඔවුන් ගඟ අයිනට ඇවිත් තිබුණා.

"මේ ගඟට කියන්නෙ පැණි කොමඩු ගඟ කියලයි" හිමවතී කිව්වා.

"බලන්න, ඉවුර දිගේ කොච්චර කොමඩු හැදිලද කියලා."

ගඟේ එක ඉවුරක සිට එහා ඉවුරට හරියට හීන් පලසක් වගේ පෙනෙන පටු පාලමක් දාලා තිබුණා. ඒක ගණකමට බොහොම සවි ශක්තිය ඇතිව තමයි හදා තිබුණෙ.

"අපි තමයි ඒක හැදුවෙ" නිල්මිණි කිව්වා. "ඒක ගොතන්න මාසයක් ම ගත වුණා. පිරිමි ළමයි ඒක ගඟ හරහා දාන්න අපිට උදවු කළා."

"ඒක හරිම විනෝදයක් වුණා" හිමවතී කිව්වා. "එක්කෙනෙක් වතුරට

වැටිලා ගිලෙන්න ම ගියා. ඒත් කවුදෝ කෙනෙක් එයාව ගොඩට ඇදගත්තා."

නිල්මිණී බයක් නැතිව පාලම උඩින් ගඟේ එහා පැත්තට ගියා. වැඩ බැරියාත් බය නැතිවා වගේ යන්නට හැදුවත්, පාලම පැද්දෙනවා දැනෙද්දි හිටි තැනම නතර වුණා.

"ඇයි නැවතුණේ?" හිමවතී ඇහුවා.

"ඔයා බයයිද?"

"මොන බයක්ද? මම මේ හිතුවෙ මේක හරි අගේ ඇති පාලමක් කියලයි."

ඔහු නැවතිලා පාලමේ අයිනකට වුණේ බය නැති බව අඟවන්නට හිනා වෙමින්.

හිමවතී ඔහුගේ එක අතකින් අල්ලා ගත්තා. අනික් අත නිල්මිණී අල්ලා

ගත්තා. දෙදෙනා ම එකතු වෙලා වැඩ බැරි දාසව පාලමෙන් එගොඩ කළා. ඔහු බය වෙලා ඉන්න හැටි දෙදෙනා ම දුටුවත් හිනා වුණේ නම් නැහැ. මොකද ඔවුන් දන්නවා පිරිමි ළමයින්ට කවුරු හරි හිනා වුණොත් ඒක ඉවසාගන්න බැහැ කියා.

පාලමෙන් එගොඩ වෙලා පාර දිගේ ඇවිදගෙන ගිය ඔවුන්ට කොළ පාට වහලය ඇති නිවසක් හමු වුණා. ඒ නිවස සුදු පාටයි.

"මෙන්න අපේ රෝහල" නිල්මිණි කිව්වා.

වැඩ බැරි දාසගේ හපන්කම් ගැන ඔබ වැඩි දුරටත් සැලකිලි දක්වයි නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරයි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

රෝහලේ දී

ප්‍රසංගය

www.kanolbooks.com

Rs. 400/-

KANOL
PUBLISHING HOUSE (PVT) LTD.

071 3493447 011 2760036

facebook.com/kanol publish

kanolpublish@gmail.com

83/16/A, Hokandara East, Hokandara

ISBN 978-624-5937-80-6